සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

32947

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 9 ශ්‍රේණිය | ගණිතය | කාලය / நேரம் / Time : පැය 02 |

නම / பெயர் / Name ..................................................   විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................................

## I කොටස

★ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පැයට කිලෝමීටර් 120 ක වේගයෙන් ගමන් කරන දුම්රියක් මිනිත්තු 45 ක් තුල ගමන් කරන දුර සොයන්න.

02. රුපියල් 8.65 ආසන්න රුපියලට වටයන්න.

03. $x=\frac{1}{4}$ හා $y=3$ වන විට දී ඇති විජීය ප්‍රකාශනයේ අගය සොයන්න. $4x+8y$

04. සුළු කරන්න. $\frac{3}{8}+\frac{3}{8}$ ත් $\frac{1}{3}$

05. 


$x^0$ හි අගය සොයන්න.

06. බෙහෙත් පෙත්තක ස්කන්ධය 60 mg කි. එවැනි පෙති 100 ස්කන්ධය ග්‍රෑම් වලින් සොයන්න.

07. විසඳන්න. $2x-8=x+1$

08. රූපයේ දැක්වෙන වෘත්තයේ කේන්ද්‍රය O වන අතර PQ හි මධ්‍ය ලක්ෂ්‍යය R වේ.
$OR=3$ cm ද $PQ=8$ cm ද නම්, වෘත්තයේ අරය සොයන්න.



09. අගය සොයන්න. $101_{දෙක} + 111_{දෙක}$

10. $x(x+7)-5x-35$ සාධක වලට වෙන් කරන්න.

11. රූපයේ දී ඇති තොරතුරු අනුව $x^0$ හි අගය සොයන්න.




12. සුළු කරන්න. $2024+202.4+20.24$

13. බීජ 200 කින් යුත් සාම්පලයක බීජ 5% ක් පැල නොවන බවට පැවසේ. එම ප්‍රමාණය සොයාගැනීමට විද්‍යාත්මක ගණක යන්ත්‍රයේ යතුරු පුවරුව ක්‍රියාත්මක කළ යුතු ආකාරය දක්වන්න.




14. $5.2\times10^{-2}$ සාමාන්‍ය ආකාරයෙන් ලියන්න.

15. $x(5-x)+x^2$ වරහන් ඉවත් කර සුළු කරන්න.

16. $97^2-3^2$ හි අගය සාධක දැනුම භාවිතයෙන් සොයන්න.

17. රූපයේ දී ඇති කරත්ත රෝදයේ අරය 56 cm කි. එහි පරිධිය සොයන්න.



18. $v=u+at$ සූත්‍රයේ $t$ උක්ත කරන්න.

19. සුළු කරන්න. $3x^2\times2x^{-1}$

20. A හා B යනු නිවාස දෙකකි. මෙම නිවාස දෙකට සමදුරින් පිහිටන සේ ළිඳක් කැපීමට අවශ්‍ය වේ. පථ පිළිබඳ දැනුම භාවිතයෙන් ළිඳ කැපීමට සුදුසු ස්ථානයක් ලබාගැනීමට අදාළ පථය දළ සටහනකින් දක්වන්න.




Samsung Triple Camera
Shot with my Galaxy A03s



CamScanner

## II කොටස

★ **ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 12 කි.**

01. වගා භූමියක මිරිස් පැළ සිටුවා තිබුණේ පහත පරිදිය. එහි පළමු පේළියේ පැළ 6 ක් ද, ඉන්පසු සෑම පේළියකම පෙර පේළියට වඩා පැළ 4 බැගින් වැඩිවන ආකාරයටය.

i) එහි මුල් පේළි 3 හි තිබූ පැළ සංඛ්‍යා පිළිවෙලින් ලියන්න. (ල. 02)

ii) ලැබෙන රටාවේ පොදු අන්තරය සොයන්න. (ල. 01)

iii) රටාවේ පොදු පදය ලබාගන්න. (ල. 02)

iv) පැළ 62 ක් ඇත්තේ කී වැනි පේළියේ ද ? (ල. 03)

v) 20 වන පේළියේ ඇති පැළ සංඛ්‍යාව සොයන්න. (ල. 02)

vi) රෝගී තත්වයක් නිසා 19, 20, 21 යන පේළි 3 හි ඇති මිරිස් පැළ ගලවා දමන ලද නම් එසේ ගලවා දමන ලද පැළ සංඛ්‍යාව සොයන්න. (ඉහත v හි පිළිතුර උපයෝගී කරගන්න.) (ල. 02)

**ලකුණු 12**

---

02. (a) $\left(\frac{7}{8} - \frac{1}{4}\right) \div 1\frac{1}{4}$ සුළු කරන්න. (ල. 03)

(b) විදුලි උඳුනක් රු. 8 000 කට මිලට ගත් වෙළෙන්දෙක් රු. 9 200 කට විකිණීමට මිල ලකුණු කළේය.

i) ඔහු අපේක්ෂා කළ ලාභය කොපමණද ? (ල. 01)

ii) අපේක්ෂිත ලාභ ප්‍රතිශතය කවරේද ? (ල. 02)

iii) උඳුන විකිණීමේ දී 5% ක වට්ටමක් දෙන ලද නම් එය විකුණූ මිල කීයද ? (ල. 03)

iv) වෙළෙන්දා 15% ක ලාභයක් ලැබෙන සේ රු. 11 500 කට මිල ලකුණු කරන ලද වෙනත් වර්ගයේ විදුලි උඳුනක ගත් මිල කොපමණද ? (ල. 03

**ලකුණු 12**

---

03. (a) දිග මීටර් a ද, පළල මීටර් b ද වන සෘජුකෝණාස්‍රාකාර පාත්තියක රෝස මල් වවා ඇත

i) එය රූපසටහනක දක්වා දී ඇති මිනුම් ලකුණු කරන්න. (ල. 01)

ii) ඉහත රෝසමල් පාත්තියේ දිග 3 m කින් ද පළල 2 m කින් ද පුළුල් කර රූපසටහනේ දැක්වෙන මල් වර්ග 4 ක් වැවීමට අදහස් කරයි. එම තොරතුරු ඔබ ඇඳි රූපයේ දක්වා එක් එක් මල් වර්ගය වවා ඇති කොටස් වල වර්ගඵල වෙන වෙනම සොයන්න. (ල. 04)

| | |
|---|---|
| රෝස | ඕකිඩ් |
| ඇන්තූරියම් | ඉද්ද |

iii) පුළුල් කරන ලද නව පාත්තියේ වර්ගඵලය ද්විපද ප්‍රකාශන දෙකක ගුණිතයක් ලෙස ලියා ඒ ඇසුරින් පාත්තියේ වර්ගඵල ලියා දක්වන්න.

ඉහත (ii) හි වර්ගඵල වල එකතුව හා (iii) හි පිළිතුරු අතර සම්බන්ධය ලියා දක්වන්න. (ල. 03)

(b) $3x - 2y = 11$

$x + 2y = 9$ සමගාමී සමීකරණ විසඳන්න. (ල. 04)

**ලකුණු 12**

---

04. i) 8 cm දිග රේඛා ඛණ්ඩයක් නිර්මාණය කර එය AB ලෙස නම් කරන්න. (ල. 01)

ii) [illegible] AB රේඛාවට ලම්බයක් නිර්මාණය කරන්න. (ල. 02)

iii) එම ලම්බය මත AC = 5.5 cm වන පරිදි C ලක්ෂ්‍යය ලකුණු කර ABC ත්‍රිකෝණය ලබාගන්න. (ල. 02)

iv) A හා B [illegible] ය නිර්මාණය කර එය AC හමුවන ලක්ෂ්‍යය P ලෙස නම් කරන්න. (ල. 03)

Samsung Triple Camera
Shot with my Galaxy A03s



CamScanner

(ල. 02)

v) P කේන්ද්‍රය ද PC අරය ද වන වෘත්තය නිර්මාණය කරන්න. (ල. 02)

vi) ඉහත ඔබ නිර්මාණය කළ ABC ත්‍රිකෝණයේ පරිවෘත්තය සම්පූර්ණ කරන්න.

ලකුණු 12

05. (a) රූපයේ ABC සමපාද, A හි ද, BCDE සෘජුකෝණාස්‍රයක් ද වේ. $A\hat{B}E = A\hat{C}D$ බව පෙන්වීමට පහත පියවර කරගෙන, දත්ත ලකුණු කර පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.



$A\hat{B}C$ = ............... (සමපාද, A හා කෝණ)

............... = $B\hat{C}D$ (.............................)

$A\hat{B}C$ + ............... = ............... + $B\hat{C}D$

එනම් ............... = ...............//

(ල. 05)

(b) රූපයේ දක්වා ඇති දත්ත අනුව,




i) $F\hat{D}E$ හි අගය සොයන්න. (ල. 02)

ii) BC // FD බව පෙන්වන්න. (ල. 02)

iii) DB යනු DC හා DF රේඛා වලට සමදුරින් වන ලක්ෂ්‍යයන්ගේ පථය වේ නම්, $C\hat{B}D$ හි අගය සොයන්න. (ල. 03)

ලකුණු 12

06.

| x | -2 | -1 | 0 | 1 | 2 (A) | 3 |
|---|---|---|---|---|---|---|
| y | -5 | -3 | -1 | 1 | ....... | 5 |

i) සුදුසු ඛණ්ඩාංක තලයක් ඇද A මගින් දැක්වෙන ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක හැර ඉතිරි ඛණ්ඩාංක එහි ලකුණු කර ඒවා යා කිරීමෙන් සරල රේඛීය ප්‍රස්තාරයක් ලබාගන්න. (ල. 04)

ii) එම ප්‍රස්තාරය භාවිතයෙන් A ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක ලියන්න. (ල. 01)

iii) ප්‍රස්තාරයේ අන්තඃඛණ්ඩය (c) සොයන්න. (ල. 02)

iv) ප්‍රස්තාරයේ අනුක්‍රමණය (m), m = 2 නම් m හා c හි අගයන් යොදා ගනිමින් ඉහත ප්‍රස්තාරයේ සමීකරණය $y = mx + c$ ආකාරයට ලියන්න. (ල. 02)

v) ඉහත ඔබ ඇඳි ප්‍රස්තාරයේ සියලුම ලක්ෂ්‍යයන් ඒකක 2 බැගින් ඉහළට විස්ථාපනය කර ඉහත ඛණ්ඩාංක තලය මතම ලකුණු කර යා කරන්න. එම සරල රේඛා දෙක අතර දක්නට ඇති විශේෂත්වය කුමක්ද? (ල. 03)

ලකුණු 12

07. උද්‍යානයක ඇති ඝනකාභ හැඩැති ජල ටැංකියක ඇතුළත දිග, පළල හා උස පිළිවෙලින් 4m, 3m, 2m වේ. මෙම ටැංකිය සම්පූර්ණයෙන් පිරී ඇති විට එම උද්‍යානයේ ඇති නිවාස 40 සඳහා දිනකට අවශ්‍ය ජලය ලබාදීමට සරිලන ප්‍රමාණවත් වේ.

i) ජල ටැංකියේ ඇතුළත පරිමාව සොයන්න. (ල. 02)

ii) ටැංකියේ ධාරිතාව ලීටර වලින් සොයන්න. (ල. 01)

iii) සෑම නිවසකම සමානව ජලය පරිභෝජනය කරන්නේ නම් නිවසක සාමාන්‍ය දෛනික ජල පරිභෝජනය ලීටර කීයද? (ල. 02)

iv) ජල ඒකකයක් සඳහා රු. 25 ක් අය කරයි නම් මාසයක (දින 30) කාලයක් සඳහා එක් නිවසක ජල ගාස්තුව කොපමණ වේද? (1000 l = ඒකක 1 යි) (ල. 03)

v) ටැංකියට ජලය සපයන නලයෙන් මිනිත්තු 12 කදී ජලය 3600 l ක් පුරවයි නම්,

(a) මිනිත්තු 25 කදී පිරෙන ජල ප්‍රමාණය (ල. 02)

(b) $3m^3$ ක් පිරවීමට නලයට ගතවන කාලය සොයන්න. (ල. 02)

ලකුණු 12



Samsung Triple Camera

CamScanner

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION · pesuru Prakashana Private Ltd. · Akura Pilot · සමනල දැනුම · T · සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**